# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
## உள்நாட்டு இறைவரித் திணைக்களம்
## DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 2135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


මුද්දර ගාස්තු චක්‍රලේඛ ලිපි : SEC/2019/01

2019 මැයි මස 14 වන දින

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්

**2008 අංක 10 දරන මුද්දර ගාස්තු ( විශේෂ විධිවිධාන ) (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 2006 අංක 12 දරන මුද්දර ගාස්තු ( විශේෂ විධිවිධාන ) පනතේ විධිවිධාන සහ නියෝග ප්‍රකාර, 2018 ඔක්තෝබර් මස 01 වන දින හෝ එදිනට පසුව නිකුත් කරනු ලබන මත්පැන් විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් හෝ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් මත මුද්දර ගාස්තු අය කර එකතුකර ගෙවීම.**

2018 ඔක්තෝබර් මස 01 වන දින අංක 2091/3 හා 2018 දෙසැම්බර් මස 31 වන දින අංක 2104/5 දරන අති විශේෂ ගැසට් පත්‍ර මගින් කරන ලද නියෝගයන් හා උපලේඛන 4 (ආ) වන අයිතමයට අනුකූලව 2018 ඔක්තෝබර් මස 01 වන දින හෝ එදිනට පසුව නිකුත් කරනු ලබන;

(i) යම් රටබීම බලපත්‍රයක් (FL) සමග නිකුත් කරනු ලබන, AFL 1, AFL 2, AFL 3 හා AFL 4 යන අරක්කු බලපත්‍ර අතුරින් යම් අරක්කු බලපත්‍රයක් හෝ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් හැර මත්පැන් විකිණීම සඳහා වූ යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට

(අ) යම් ලිත් වර්ෂයක් සඳහා නිකුත් කරන ලද විදේශ මත්පැන් විකිණීමේ බලපත්‍රයක් මත මුද්දර ගාස්තු රු. 20,000/- ක් ද,

(ආ) යම් ලිත් වර්ෂයක් තුළ වර්ෂයකට අඩු කාලයක් සඳහා යම් ස්ථානයක පවත්වාගෙන යන මත්පැන් වෙළෙඳසැලකට නිකුත් කරනු ලබන විදේශ මත්පැන් විකිණීමේ බලපත්‍රය වරින්වර දීර්ඝ කිරීමේ යම් බලපත්‍රයක් මත මුද්දර ගාස්තු රු. 20,000/- ක් ද,

(ii) යම් රටබීම බලපත්‍රයක් (FL) සමග නිකුත් කරනු ලබන, AFL 1, AFL 2, AFL 3 හා AFL 4 යන අරක්කු බලපත්‍ර අතුරින් යම් අරක්කු බලපත්‍රයක් මත මුද්දර ගාස්තු රු. 2,000/- ක් හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන මෙවායින් කවර හෝ වැඩි මුදල ද,

(iii) බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත මුද්දර ගාස්තු රු. 2,000/-ක් හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන මේවායින් කවර හෝ වැඩි මුදල ද,

අයකල යුතු බව, ඉතා කාරුණිකව දන්වමි.

02. මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය ප්‍රකාර, අයකර ගත් මුද්දර ගාස්තු ප්‍රමාණය නියමිත කාර්තුව අවසාන වී දින 15 ක් (පහළොවක්) ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය. ඒ අනුව අයකර ගත් මුද්දර ගාස්තු ප්‍රමාණය, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නමට අණකරන ලද චෙක්පත් අණකර මෙම දෙපාර්තමේන්තුව වෙත එවීමෙන් වැළකී සිටින ලෙසද, ලංකා බැංකුවේ අංක : 4153842 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ මුද්දර ගාස්තු ගිණුමට ප්‍රේෂණය කර, එක් එක් කාර්තුව අවසානයේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු සමථයකට පත් කරන ලද මුද්දර ගාස්තු පිළිබඳ ප්‍රකාශනයේ එකී ප්‍රේෂණය කිරීම සම්බන්ධව තොරතුරු සඳහන් කර, සහතික කළ යුතු බවද, ඉතා කාරුණිකව දන්වමි.

නදුන් ගුරුගේ
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

නදුන් ගුරුගේ
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත
කොළඹ 02.

පිටපත් :
1. විගණකාධිපති සහ ජාතික විගණන කොමිෂන් සභාවේ සභාපති
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. සුරාබදු කොමසාරිස් ජනරාල්
4. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය